පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
Police Media Division

කැ.පෙ. අංකය
த.பெ.இ
P.O. Box No
517

ෆැක්ස්
தொலை நகல்
Fax
011-2329500

දුරකථනය
தொலைபேசி
Telephone
011-2384024
011-2395605

වෙබ් ලිපිනය
இணைய தளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E mail
dir.media@police.lk

මගේ අංකය
எனது இல
My No
796 / 2022

ඔබේ අංකය
உமது இல
Your No

දිනය
திகதி
Date
2022.05.27
පැය 2030

මාධ්‍ය නිවේදනය

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,
අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,
සියළුම මාධ්‍ය ආයතන.

කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණ මගින් විරෝධතාකරුවන් වෙත පනවනු ලැබූ අධිකරණ නියෝගයක් සම්බන්ධව.

ගාලුමුවදොර හා ජනාධිපති ලේකම් කාර්යාලය ආශ්‍රිතව පවත්වාගෙන යනු ලබන උද්ඝෝෂණය හා විරෝධතාවය සඳහා දින 50 ක කාලයක් පිරීම නිමිත්තිකරගෙන විරෝධකරුවන් විසින් 2022.05.28 වන දින පැවැත්වීමට සැලසුම් කර ඇති උද්ඝෝෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් කොටුව පොලිස් ස්ථානාධිපතිවරයා විසින් 2022.05.27 වන අද දින කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් සිදු කරන ලද ඉල්ලීමකට අනුව එම උද්ඝෝෂණය මෙහෙයවනු ඇතැයි සැලකෙන පාර්ශවකරුවන් වන ජීවන්ත පිරිස් පියතුමා, රංගන ලක්මාල්, එරංග ගුණසේකර, වසන්ත මුදලිගේ, ලහිරු වීරසේකර හා ජෝසප් ස්ටාලින් ඇතුළු සහභාගි වන අනෙකුත් සාමාජික සාමාජිකාවන් සඳහා කොල්ලුපිටිය මංසන්ධියේ සිට කොටුව අධිකරණ බල සීමාව තුළ පිහිටි ප්‍රධාන ආර්ථික මරමස්ථාන, කිසිදු රාජ්‍ය ආයතනයකට, නිල නිවසකට, ඇතුළුවීම, හානි කිරීම, එම ප්‍රදේශයේ රාජකාරි කරනු ලබන නිලධාරීන්ට බාධා කිරීම, ප්‍රචණ්ඩකාරී සහ නීතිවිරෝධී ක්‍රියාකාරකම් වලින් තොරව සිදු කල යුතු බවත්, **කොටුව පොලිස් වසමේ එන්.එස්.ඒ වටරවුමේ සිට වෛත්‍ය පාර, එන්.එස්.ඒ වටරවුමේ සිට ජනාධිපති මාවත, සෙරමික් හන්දියේ සිට යෝර්ක් වීදිය, ලෙඩ් බැස්ටියන් මාවත දක්වාත් මුදලිගේ මාවත, රෝහල් වීදිය, බැංකු මාවත, බාරොන් ජයතිලක මාවත, වැතම් වීදිය කැනල් පාර යන මාර්ගවල ගමන් කිරීම එකී මාර්ග වලට ඇතුළු වීම 2022 මැයි 28 වන දින සිදු නොකළ යුතු බවට කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය මගින් නියෝග කර ඇත.**

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.